2025 අගෝස්තු
ජනතා විමුක්ති පෙරමුණේ
අධ්‍යාපන අංශයේ ප්‍රකාශනයකි.

තොරතුරු මාසිකය

# විමර්ශන

ලෝකය වෙනස් කිරීමට වෙනස් වෙමු!

# ආර්ථික ස්ථායිකරණය

**ශ්‍රී ලංකාවේ ආර්ථිකය යළිත් පණ ලබමින්, ස්ථාවර වෙමින් ඉදිරියට යන බව ආර්ථිකය ගැන හැදෑරීමක් කරන ඕනෑම අයකුට අවබෝධ වන කරුණකි. 2025 වසරේ ගතවූ මාස හයක කාලය තුළ ආර්ථිකය තුළ ඇතිවී තිබෙන වර්ධනය බොහෝ ආර්ථික නිර්ණායක මඟින් තහවුරු වේ. විශේෂයෙන්ම උද්ධමනය, විදෙස් සංචිත, විනිමය අනුපාත, අපනයන, විදෙස් ප්‍රේෂණ වැනි සියලු අංශවල වර්ධනයක් දැකගත හැකි අතර, එය ආර්ථික ස්ථායීකරණයේදී වඩා වැදගත් වේ. නැවතී තිබුණු ආර්ථිකයක් මෙතරම් කෙටි කාලයකදී ස්ථාවර කර ගැනීමම විශාල ජයග්‍රහණයකි.**

| සංචාරකයින් සංඛ්‍යාව සහ ආදායම (02-වගුව) | | | | |
|---|---|---|---|---|
| මාසය | සංචාරකයන් ප්‍රමාණය 2024 | ආදායම (ඩො.මි.) | සංචාරකයන් ප්‍රමාණය 2025 | ආදායම (ඩො.මි.) |
| ජනවාරි | 208,253 | 342 | 252,761 | 401 |
| පෙබ. | 218,350 | 346 | 240,217 | 368 |
| මාර්තු | 209,181 | 338 | 229,298 | 354 |
| අප්‍රේල් | 148,867 | 226 | 174,608 | 257 |
| මැයි | 112,128 | 154 | 132,919 | 164 |
| ජුනි | 113,470 | 151 | 138,241 | 170 |
| එකතුව | 1,010,249 | 1557 | 1,168,044 | 1,713 |

පසුගිය කාලයේ ලංකාවේ ආර්ථිකයට ප්‍රධාන බලපෑමක් එල්ල වූයේ විදෙස් විනිමය අඩුවීමේ ගැටලුවෙනි. එයට යම්තාක් දුරට සහනයක් වෙමින් පසුගිය මාස හයක කාලය තුළ විදෙස් විනිමය ලැබීම්වල යම්කිසි වර්ධනයක් දක්නට ලැබේ. අපනයන ආදායමෙහි පසුගිය කාලයේ සිදුවූ වර්ධනය මෙයට කදිම උදාහරණයකි.

2025 වර්ෂයේ පසුගිය මාස හයක ශ්‍රී ලංකාවේ අපනයන ආදායම අංක 01 වගුව පරිදි වේ.

| 2025 වර්ෂයේ මාස හයක අපනයන ආදායම (01-වගුව) | | | |
|---|---|---|---|
| මාසය | 2024 ඇ.ඩො. මි. | 2025 ඇ.ඩො. මි. | % |
| ජනවාරි | 971 | 1053 | 8.3 |
| පෙබරවාරි | 1059 | 1056 | -0.1 |
| මාර්තු | 1148 | 1242 | 8.1 |
| අප්‍රේල් | 878 | 968 | 10.4 |
| මැයි | 1011 | 1035 | 2.3 |
| ජුනි | 1031 | 1151 | 11.6 |
| එකතුව | 6098 | 6505 | |

ඉහත සංඛ්‍යා ලේඛනයට අනුව 2024 වර්ෂයට සාපේක්ෂව 2025 වර්ෂයේ පෙබරවාරි මාසය හැරුණුවිට ඉතිරි මාස පහේම අපනයන ආදායම ඉහළ ගොස් ඇත. ඒ අනුව 2024 වර්ෂයට වඩා මුල් මාස හය තුළ අපනයන ආදායම ඩොලර් මිලියන 407කින් ඉහළ ගොස් ඇති අතර, එය ප්‍රතිශතයක් ලෙස 6.6%ක වර්ධනයකි. ජුනි මාසයේ පමණක් 11.6%කින් ඉහළ ගොස් තිබිණි.

මෙම අපනයන ආදායමට සමගාමීව සංචාරක ව්‍යාපාරයෙන් ලැබෙන ආදායමද ඉහළ ගියේය. රට තුළ පවතින නිදහස් සහ සාමකාමී පරිසරය මෙයට ප්‍රධාන වශයෙන් බලපා ඇත.

අංක 02 වගුවේ සඳහන් සංඛ්‍යාලේඛනය අනුව 2025 පළමු මාස 06 සඳහා සංචාරක ව්‍යාපාරයේ වර්ධනයක් වාර්තා කර ඇති අතර, පසුගිය වසරට වඩා ඩොලර් මිලියන 156ක වැඩිවීමක් දැකගත හැකිය. ඒ අනුව මේ වසර අවසාන වනවිට සංචාරක ව්‍යාපාරයේ ආදායම ඩොලර් මිලියන 4,000 සීමාවට පහසුවෙන් ළඟාවිය හැකි බව පෙනී යයි.

මීළඟට අප සැලකිල්ලට භාජනය කළ යුතු අංශය වන්නේ විදෙස්ගත ශ්‍රමිකයන් විසින් ලංකාවට එවන ලද මුදල් හෙවත් විදේශ ප්‍රේෂණ ප්‍රමාණයයි. එය කලක් ඩොලර් මිලියන 7,000 පසුකර තිබූ අතර, ආර්ථික අර්බුදය උග්‍ර වීම නිසා මෙම ප්‍රමාණය වසරකට ඩොලර් මිලියන 3,500 සීමාව දක්වා පල්ලම් බැස්සේය. දැන් එය නැවත යථා තත්ත්වයට පත්වෙමින් තිබෙන බව පසුගිය මාස හයෙහි සංඛ්‍යා හරහා අවබෝධ කරගත හැකිය. (03-වගුව)

ඒ අනුව විදෙස් ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ 2024 වසරට සාපේක්ෂව ඩොලර් මිලියන 598කින් ඉහළ ගොස් ඇත. මේ තත්ත්වය යටතේ වසර අවසන් වන විට විදෙස් ශ්‍රමික ප්‍රේෂණ ප්‍රමාණය ඩොලර් මිලියන 7,000 ඉතා පහසුවෙන් ඉක්මවා යා හැකි අතර, එසේ ලැබීම වසර ගණනකට පසුව අප ලබන විශාල ජයග්‍රහණයකි.

මෙම ආර්ථික වර්ධනය තහවුරු කරනු ලබන තවත් දර්ශකයක් වන්නේ කාර්මික නිෂ්පාදන දර්ශකයයි. 2024 වර්ෂයට සාපේක්ෂව 2025 වර්ෂයේ මෙම දර්ශකයේ වර්ධනයක් දක්නට ලැබෙන

07 කලාපය

# එක්සත් ජනපද තීරුබදු බලපෑම්

**ධනවාදය සාධාරණ සහ නිදහස් වෙළෙඳුමක් ගැන කතා කළද, එය තමන්ගේ පැත්තට එන විට තත්ත්වය වෙනස්ය. න්‍යාය නිදහස් නව ලිබරල් වුවත්, ක්‍රියාව තහනම් කිරීම, බදු පැනවීම, සීමා කිරීම වැනි දේවල්ය. ධනවාදයේ න්‍යාය සහ භාවිතය ගැන හදාරන්නට මෙම ට්‍රම්ප්ගේ ආනයන බදු ප්‍රතිපත්තිය ඉතා වැදගත් වේ. ධනේශ්වර ආර්ථිකයන් අර්බුදයට යන විට ඔවුන්ගේ න්‍යායන්ම ඔවුන්ට පාරාවළල්ලක් වන අවස්ථා අප ඕනෑ තරම් දැක ඇති අතර, මෙයද එවැනි එක්තරා අවස්ථාවකි.**




මේ වනවිට මුළු ලෝකයම ට්‍රම්ප්ගේ තීරු බදු ප්‍රතිපත්තිය ගැන කතා කරන්නට පටන්ගෙන තිබේ. ඒ එක්සත් ජනපදය තමන් ආනයනය කරනු ලබන භාණ්ඩ මත පැනවූ තීරු බද්ද (Reciprocal Tariff) සමගය. මෙලෙස තීරු බදු පැනවීම අලුත් දෙයක් නොවන අතර, ක්‍රිස්තු පූර්ව 2000 පමණ කාලයේදීත් රජවරුන් විසින් තමන්ගේ රටවලට එන භාණ්ඩ වෙනුවෙන් බදු පනවා තිබිණි. මුල් කාලයේ මෙම බදුවල අරමුණ වූයේ රාජ්‍ය ආදායම වැඩිකර ගැනීම වුවත්, පසුව එයට ජාතික නිෂ්පාදන සහ කර්මාන්ත ආරක්‍ෂා කර ගැනීමේ අවශ්‍යතාවත් එක්විය. මේවා විධිමත්ව සිදුවන්නට පටන් ගැනුණේ ග්‍රීක සහ රෝම රාජ්‍යයන් තුළය. ක්‍රිස්තු පූර්ව 5 සියවසේ සිට ස්ථාවර වූ මෙම බදු එහි උපරිමයට පැමිණියේ ධනවාදයේ ආරම්භයත් සමගය. 18 වැනි ශතවර්ෂයේදී එංගලන්තයට අපනයනය කරනු ලබන භාණ්ඩ වෙනුවෙන් 40% - 50% අතර ප්‍රතිශතයකින් බදු පනවා තිබිණි.

ධනේශ්වර රාජ්‍යයක රාජ්‍ය ආදායම ලබා ගැනීම සඳහා භාවිත කරනු ලබන එක් උපක්‍රමයක් වන්නේ මෙලෙස බදු පැනවීමයි. එය එක් අතකින් දේශීය නිෂ්පාදන ආරක්ෂා කර ගැනීම, අනවශ්‍ය පරිභෝජන සීමා කිරීම, විනිමය අනුපාතයන් සහ සංචිත හැසිරවීම වැනි කරුණු සඳහා උපයෝගී වේ.

විදේශ වෙළෙඳ ගනුදෙනුවලදී රටවල් මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් බවට පත්වන්නේ එම රටවල් කාලයෙන් කාලයට අනුගමනය කරනු ලබන බදු ප්‍රතිපත්තීන්ය. සමහර රටවල් තම රටෙහි ආර්ථිකයෙහි ඇතිවන වෙනස්කම් සැලැකිල්ලට ගනිමින්, ආරක්ෂණවාදී ප්‍රතිපත්ති ලෙස ආනයන - අපනයන බදු ප්‍රතිපත්ති වෙනස් කර ගනී. ඒ අතර තවත් රටවල් දේශපාලන අරමුණු වෙනුවෙන් බදු ප්‍රතිපත්ති හසුරුවමින් සිටී. විශේෂයෙන් ජාත්‍යන්තර වෙළෙඳපොළ හැසිරවීමේදී අනෙකාගේ ආර්ථිකයන් සහ නිෂ්පාදනයන් අඩපණ කිරීම වෙනුවෙන්ද මෙම බදු ප්‍රතිපත්ති උපයෝගී කර ගනු ලැබේ. ජාත්‍යන්තර වෙළෙඳාමේදී වෙළෙඳපොළවල් අතර සිදුවන තරගය සහ රටවල් අතර පවතින සීතල යුද්ධය නිසා බොහෝ විට බැටකන්නේ එම රටවල් සමඟ ගනුදෙනු කරනු ලබන අනෙකුත් රටවල්ය. විදේශ වෙළෙඳාමේදී විශේෂයෙන්ම දුප්පත් රටවල් සහ ආර්ථික අතින් දුබල රටවලට බලවත් රටවලින් කරනු ලබන බලපෑම ඉතා විශාලය. ශ්‍රී ලංකාව වැනි රටවලටද මෙලෙස විදේශ වෙළෙඳාමේදී ඇතිවන බලපෑම සුළුපටු නොවේ.

එක්සත් ජනපදය සහ චීනය අතර ඇති සීතල වෙළෙඳ යුද්ධයේ එක් අවස්ථාවක් ලෙස අප්‍රේල් මාසයේ කරළියට ආ එක්සත් ජනපදයේ ආනයන මත පනවන තීරු බදු ඉහළ දැමීම දැකිය හැකිය. මෙහි අවසාන ප්‍රතිඵලය වූයේ ආර්ථික අතින් නොදියුණු රටවල් එම තීරණයෙන් අපහසුතාවට පත්වීමයි. මුලදී ඉහළ බදු අනුපාතයන් පනවනු ලැබ පසුව අඩු ප්‍රතිශතයකට එය මාරු කරනු ලැබීය. එය බොහෝ රටවලට සහනයක් ලෙස දැනුණද එයින් පැනවූ නව බද්ද මත මිල ඉහළ යාම සැඟවී ගියේය.

ධනවාදය සාධාරණ සහ නිදහස් වෙළෙඳුමක් ගැන කතා කළද, එය තමන්ගේ පැත්තට එන විට තත්ත්වය වෙනස්ය. න්‍යාය නිදහස් නව ලිබරල් වුවත් ක්‍රියාව තහනම් කිරීම, බදු පැනවීම, සීමා කිරීම වැනි දේවල්ය. ධනවාදයේ න්‍යාය සහ භාවිතය ගැන හදාරන්නට

| රට | අප්‍රේල් 09 | අගෝස්තු 01 |
|---|---|---|
| ශ්‍රී ලංකාව | 44% | 20% |
| ලාඕසය | 48% | 40% |
| මියන්මාරය | 44% | 40% |
| බංග්ලාදේශය | 37% | 40% |
| ඉන්දියාව | 26% | 20% |
| පාකිස්ථානය | 29% | 25% |
| මැලේසියාව | 24% | 19% |
| තායිලන්තය | 36% | 19% |
| ඇෆ්ගනිස්ථානය | 10% | 15% |
| ස්විට්සර්ලන්තය | 31% | 39% |
| පිලිපීනය | 17% | 19% |
| චීනය | 34% | 10% |
| වියට්නාමය | 46% | 20% |

මෙම ට්‍රම්ප්ගේ ආනයන බදු ප්‍රතිපත්තිය ඉතා වැදගත් වේ. ධනේශ්වර ආර්ථිකයන් අර්බුදයට යනවිට ඔවුන්ගේ න්‍යායන්ම

ඔවුන්ට පාරාවළල්ලක් වන අවස්ථා අප ඕනෑතරම් දැක ඇති අතර, මෙයද එවැනි එක්තරා අවස්ථාවකි.

එක්සත් ජනපදය විසින් නව තීරු බදු ක්‍රමය යටතේ රටවල් කිහිපයකට යෝජනා කරන ලද බදු අනුපාතයන් සහ පසුව එකඟවූ අනුපාතයන් පහත දැක්වේ.

ඉහත දත්තවලට අනුව වැඩිම ප්‍රතිශතයක් අඩු කර ඇත්තේ, වියට්නාමයට සහ ශ්‍රී ලංකාවටයි. ඒ අනුව අප්‍රේල් 09 යෝජනාවට අදාළව වියට්නාමයට 26%ක් සහ ශ්‍රී ලංකාවට 24%ක් අඩු කර ඇත. එලෙසම ඇෆ්ගනිස්ථානය, ස්විට්සර්ලන්තය සහ පිලිපීනය යන රටවලට කලින් පැනවූ බදු අනුපාතයන්ට වඩා වැඩි බදු අනුපාතයන් පනවා ඇත. මෙම බද්ද පැනවීමට පදනම ලෙස ගත්තේ එක්සත් ජනපදය සමඟ යම්කිසි රටක් කරනු ලබන විදේශ වෙළෙඳාමේ ප්‍රමාණයයි. ඒ අනුව නිර්ණායකය ලෙස ගත්තේ ආනයන සහ අපනයන අතර පරතරයයි හෙවත් වෙළෙඳ පරතරයයි. වෙළෙඳ පරතරය විශාල නම්, ඉහළ තීරු බදු අනුපාතයකුත්, වෙළෙඳ පරතරය අඩු නම්, පහළ අනුපාතයකුත් පැනවීමට ඔවුහු තීරණය කළහ. එහෙත්, නිශ්චිත ක්‍රමවේදයක් අනුගමනය කළ බවක් දැකිය නොහැකිය.

මෙම බද්ද චීනය සම්බන්ධයෙන් ගත්කල මුලදී 34%ක ප්‍රතිශතයක් පනවා තිබුණද, දැන් එය සාකච්ඡා මට්ටමට පැමිණ ඇත. ඒ අනුව චීනයට තවමත් නිශ්චිත අනුපාතයක් තීරණය කර නොමැති අතර, අගෝස්තු 12 වැනිදා එය නිශ්චිතව තීරණය කරන තෙක් 10%ක මට්ටමේ තබා ගැනීමට එකඟවී ඇත.

| රට | වටිනාකම ඩො.මි. | ආනයනවල ප්‍රතිශතය |
|---|---|---|
| එ. ජනපදය | 2,911 | 22.8% |
| එ. රාජධානිය | 906 | 07.1% |
| ඉන්දියාව | 884 | 06.9% |
| ජර්මනිය | 629 | 04.9% |

ලංකාවේ විදේශ වෙළෙඳාමේ ස්වභාවය සැලකූ කල මෙම තීරු බද්ද කොපමණ බලපෑමක් කරයිද යන්න පැහැදිලි කරගත හැකිය.

2024 වර්ෂයේ ලංකාවේ ආනයන සංයුතිය පහත පරිදි වේ.


ඉහත සංඛ්‍යා අනුව පැහැදිලි වන්නේ අපගේ අපනයනවලින් වැඩි ප්‍රමාණයක් මිලට ගන්නේ තනි රටක් ලෙස එක්සත් ජනපදයයි. එය මුළු අපනයනවලින් 22.08%ක් තරම් විශාල ප්‍රමාණයකි. එලෙසම අපගේ මුළු අපනයන ආදායම තුළ ප්‍රධාන අපනයන භාණ්ඩය බවට පත්වන්නේ රෙදිපිළි හා ඇඟලුම් වන අතර, එහි ප්‍රතිශතය 39.6%කි.

මෙම තීරු බදු ප්‍රතිපත්තිය අපගේ අපනයන ආදායමට විශාල බලපෑමක් වන්නේ එම නිසාය.


මෙම කරුණු සලකා බැලීමේදී පැහැදිලි වන්නේ තනි රටක් මත විශාල අපනයන රඳාපැවැත්මක් නොපැවැතිය යුතු අතර, අපනයන භාණ්ඩ අතුරින් එක අපනයනයක් මත එනම්, රෙදිපිළි හා ඇඟලුම් මත රඳාපැවැත්මත් ඉතා අවාසිසහගත බවයි. එම නිසා එක්සත් ජනපදය ගන්නා මෙවැනි ඕනෑම තීරණයක් අපගේ ආර්ථිකයට සෘජුව බලපාන බවද මතක තබා ගත යුතුය.

2024 වර්ෂයේ ලංකාවේ අපනයන සංයුතිය පහත පරිදි වේ:

| රට | වටිනාකම ඩො.මි. | ආනයනවල ප්‍රතිශතය |
|---|---|---|
| චීනය | 4,366 | 23.2% |
| ඉන්දියාව | 3,870 | 20.5% |
| එ. අරාබි එමීර් රාජ්‍යය | 1,489 | 07.9% |
| සිංගප්පූරුව | 1,300 | 06.9% |
| එ. ජනපදය | 443 | 02.4% |




**එක්සත් ජනපදය සහ චීනය අතර භාණ්ඩ වෙළෙඳාම - 2024**




**ඇමෙරිකාවේ ආනයන - අපනයන පරතරය වැඩි කිරීමට දායක වන ප්‍රධාන රටවල් 10 සහ ඒවායේ වෙළෙඳ පරතරය**

# මානව පරිණාමය පිළිබඳ නූ

**පසුගිය කලාපය හා සම්බන්ධයි**

**ඩැනිසෝවන් (*Denisovan*)**

මානව පරිණාමය තුළ නියැන්ඩර්තාල් මානවයා හැරුණු විට හෝමෝ සේපියන්ට වඩාත් ආසන්නතම මානව විශේෂය ලෙස ඩැනිසෝවන් මානවයා සැලැකේ. මකර මිනිසා, එසේත් නැතහොත් හෝමෝ ලොංගි ලෙස පෙරදී නම් කර තිබූ මානව පොසිලද අයත් වන්නේ ඩැනිසෝවන් මානවයාටම බව 2025 වසරේදී සොයා ගනු ලැබීය. නියැන්ඩර්තාල් මානවයා මෙන්ම, නූතන මානවයාට සාපේක්ෂව හොඳින් වැඩුණු සහ ශක්තිමත් මානව විශේෂයක් ලෙස ඩැනිසෝවන් හඳුනා ගැනේ.


ඩැනිසෝවන් මානවයන්ගේ චාර්වක දත් නූතන මානවයාට වඩා විශාලය. ඇට වර්ග වැනි තද, ශක්තිමත් ආහාර වර්ග ආහාරයට ගැනීමට පහසු වන ආකාරයට ඔස්ත්‍රලෝපිතකස් විශේෂයන් හා අනෙකුත් පූර්ව මානව විශේෂයන් හා සමානව එම දත් සැකසී ඇත. නියැන්ඩර්තාල් මානවයාට සාපේක්ෂව කෙටි, එහෙත් ශක්තිමත් හකු මෙම මානව විශේෂයට පවතින්නට ඇතැයි විශ්වාස කෙරේ. ඩැනිසෝවන් මානවයාට තිබී ඇත්තේ පුළුල්, පැතලි සහ දිගටි හිස්කබලකි. එමෙන්ම විශාල නාස් කුහරයක්ද ඔවුන් සතු විය. එසේ සොයා ගනු ලැබූ එක් හිස්කබලක කපාල ධාරිතාව දළ වශයෙන් ඝන සෙන්ටිමීටර් 1,420ක් පමණ වේ. එය නූතන මානවයාගේ කපාල ධාරිතාවේ සාමාන්‍ය අගයට වඩා (ඝන සෙ.මී. 1350) මඳක් ඉහළ අගයකි.

ඩැනිසෝවන් මානව පොසිල තවමත් සොයාගෙන ඇත්තේ සුළු ප්‍රමාණයක් පමණක් නිසා ඔවුන්ගේ ශරීර ස්වභාවය පිළිබඳව මෙතෙක් නිශ්චිතව කරුණු පැවසිය නොහැකිය. කෙසේ නමුත්, ලැබී ඇති දත්ත අනුව ඩැනිසෝවන් කාන්තාවකගේ උස දළ වශයෙන් සෙ.මී. 168ක් පමණ ද, බර කිලෝග්‍රෑම් 78ක් පමණද වන්නට ඇතැයි විශ්වාස කෙරේ. සොයාගත් පොසිල මගින් සිදු කරන ලද ජාන පර්යේෂණ අනුව එම ජාන අයත් මානවයන් අඳුරු පැහැ සමක්, දුඹුරු පැහැ ඇස් සහ දුඹුරු පැහැ හිසකෙස් සහිත වූවන් බව සොයාගෙන ඇත.

සයිබීරියාවේ අල්ටායි කඳුකරයේ පිහිටි ඩැනිසෝවා ගුහාවෙන් මෙම මානව විශේෂයට අයත් අස්ථි කැබලි ප්‍රථම වරට සොයාගෙන ඇත. මෙම මානවයාට ඩැනිසෝවන් යන නම තබන ලද්දේ ද



***Denisovan* මානවයාගේ සාක්ෂි ඇසුරින් සකස් කළ හිසක්**





**හෝමෝ සේපියන්, නියැන්ඩතාල් සහ ඩැනිසෝවන් මානවයින්ගේ හිස්කබල් සංසන්ධනාත්මකව**




***Denisovan* මානවයා භාවිත කළ ගල් ආයුධ කිහිපයක්**

එම ගුහාවේ නම පදනම් කරගනිමිනි. රුසියානු ජාතික විද්‍යාඥයකු වන මයිකල් ෂුන්කොව් ඇතුළු විද්‍යාඥයන් පිරිසක් විසින් මෙම සොයාගැනීම සිදුකර තිබිණි. එම සොයාගැනීම 2008 වසරේ සිදු වුවද, එම අස්ථි කොටස් එතෙක් නම් කර නොතිබූ නව මානව විශේෂයකට අයත් බව විද්‍යාඥයන් විසින් තීරණය කරනු ලැබුවේ 2010 වසරේදීය. ඒ එම අස්ථි ඇසුරින් සිදුකරන ලද ජාන පර්යේෂණ (මයිටොකොන්ඩ්‍රියල් DNA) මගිනි. එම ගුහාව ආශ්‍රිතව නියැන්ඩර්තාල් සහ හෝමෝ සේපියන් මානවයන් සිටි බවටද සාක්ෂි සොයාගෙන ඇත. එහෙත්, ඩැනිසෝවන් සහ එම අනෙකුත් මානව විශේෂයන් එකම ගුහාවක එක්ව වාසය කළාදැයි මෙතෙක් නිගමනය කර නැත.

මෙතෙක් සොයාගෙන ඇති පොසිල සාක්ෂි අනුව අදින් වසර 3,00,000කට පමණ පෙර මෙම මානව විශේෂය මිහිමත වාසය කර ඇත. එහෙත් ජාන පර්යේෂණ සිදු කළ විද්‍යාඥයන් පවසන්නේ ඩැනිසෝවන් මානවයා බිහිවූ කාලය ඊට




**හෝමෝ සේපියන්, නියැන්ඩතාල් සහ ඩැ**
**සංසන්ධ**

බොහෝ පෙර සිදුව ඇති බවත්, ඔවුන් නියැන්ඩර්තාල් මානවයන්ගෙන් වෙන්ව ඇත්තේ, අදින් වසර 5,00,000කට පමණ පෙර බවත්ය. එමෙන්ම මෙම මානවයන් අදින් වසර 30,000කට පමණ පෙරත් වාසය කළ බවටද සාක්ෂි සොයාගෙන තිබේ. ජාන පර්යේෂණ කළ විද්‍යාඥයන් මේ සම්බන්ධවද අදහස් පළ කර ඇති අතර, ඒ අනුව ඔවුන් අදින් වසර 14,500කට පෙරද මිහිමත වාසය කර ඇත.

# ුතන ගවේෂණ 14 - කොටස


එය නිවැරැදි නම්, මානව විශේෂයක් ලෙස හෝමෝ සේපියන් පමණක් මිහිමත ඉතිරි කරමින්, අවසාන වශයෙන් වඳව ගිය මානව විශේෂය ඩැනිසෝවන් වනු ඇත.



රුසියාවේ සයිබීරියාවේ පිහිටි ඩැනිසෝවා ගුහාව

රුසියාවේ සයිබීරියාව ආශ්‍රිතවත්, චීනයේ ටිබෙටයේ සහ තායිවානයේත්, ලාඕසයේත් මෙම මානව විශේෂය විසූ බවට සාක්ෂි සොයාගෙන තිබේ. ජාන පර්යේෂණ අනුව ඩැනිසෝවන් මානවයා මෙම ප්‍රදේශවලට පමණක් සීමා නොවී දකුණු ආසියාව හරහා අග්නිදිග ආසියාවට ද සංක්‍රමණය වන්නට ඇතැයි විද්‍යාඥයෝ විශ්වාස කරති.

ආරම්භයේ පටන්ම විවිධාකාරයේ ගල් ආයුධ මෙම මානවයන් විසින් භාවිත කරන ලද බවට සාක්ෂි හමුව ඇත. එක් එක් කාර්යන් සඳහා ගැළපෙන පරිදි වෙන් වෙන් වශයෙන් ගල් ආයුධ නිපදවීමට ඔවුහු සමත්ව ඇත. එසේම සත්ව අස්ථි




නිසෝවන් මානවයින්ගේ ශරීර ස්වරූපය ාත්මකව

සහ ලී දඬු මඟින් නිපද වූ ආයුධ ද මෙම මානවයෝ භාවිත කර ඇත. එසේම මෙම ගුහා ආශ්‍රිතව සත්ව අස්ථිවලින් සහ කිරිග රුඬවලින් සෑදූ මුදු, මාල පෙති, අත් පළඳනා මෙන්ම ඉඳිකටු ද හමුව ඇත. එහෙත්, මෙම කාලසීමාවේදීම හෝමෝ සේපියන් මානවයාත් මෙම ප්‍රදේශවල වාසය කර ඇති බැවින්, ඒවා නිපදවූයේ ඩැනිසෝවන් මානවයා විසින්ම දැයි නිවැරැදිව ප්‍රකාශ කළ නොහැකි ය. කෙසේ නමුත්, ඒවා නිපදවිය හැකි මට්ටමේ බුද්ධි මට්ටමක් ඩැනිසෝවන් මානවයාට පවතින්නට ඇතැයි සැලැකේ.

වත්මන් හෝමෝ සේපියන් මානවයාගේ ජාන ලක්ෂණ තුළ නියැන්ඩර්තාල් මානවයාගේ මෙන්ම ඩැනිසෝවන් මානවයාගේ ජාන ලක්ෂණ ද සුළු වශයෙන් දක්නට ඇත. එයින් අදහස් වන්නේ හෝමෝ සේපියන් මානවයා මෙම මානව විශේෂ දෙවර්ගය සමඟම මුහුව ඇති බවයි. ඩැනිසෝවන් මානවයා හෝමෝ සේපියන් සමඟ පමණක් නොව නියැන්ඩර්තාල් මානවයා සමඟ ද මුහුව ඇත. ඩැනිසෝවා ගුහාවෙන් සොයා ගත් 'ඩැනිසෝවන් 11' ලෙස නම් කරන ලද මානවයා එලෙස නියැන්ඩර්තාල් මානවයා සමඟ මුහු වීමෙන් උපත ලද්දෙකි. එම ගුහාවෙන් සොයා ගත් සෙසු පොසිලවල ජාන ලක්ෂණවල ද 17% ක් පමණ නියැන්ඩර්තාල් ලක්ෂණ පවතී. එසේම ඩැනිසෝවන් මානවයාගේ ජාන ලක්ෂණවලින් 4%ක් මෙතෙක් හඳුනා නොගත් මානව විශේෂයකට අයත් බවට ද සැලැකේ. එසේ මුහු වීම මෙම මානව විශේෂය බිහි වූ මුල්ම කාලයේ යුරෝපයේ සිට ආසියාවට පැමිණෙන අතරමඟදී සිදු වන්නට ඇතැයි ද විද්‍යාඥයෝ සැක පළ කරති.

ඩැනිසෝවන් මානවයා හෝමෝ සේපියන් සමඟ මුසුව ඇති බවට වැඩි වශයෙන්ම දක්නට ඇත්තේ, අග්නිදිග ආසියා සහ පැසිෆික් කලාපය ආශ්‍රිතවයි. ඒ අනුව පැපුවා නිව්ගිනියා, නැඟෙනහිර ඉන්දුනීසියා, ෆීජි යන ප්‍රදේශවල ජනතාවගේ මෙන්ම ඕස්ට්‍රේලියා ආදිවාසීන් තුළ සහ පැසිෆික් කලාපයේ අනෙකුත් දූපත් පදනම් කරගත් ආදිවාසී ජනතාව තුළත් මෙම මිශ්‍ර වීමේ ජාන ලක්ෂණ වැඩි වශයෙන් දක්නට ඇත. ඩැනිසෝවන් මානවයා මෙම කලාපයේ ද අතීතයේ වාසය කරන්නට ඇතැයි සැලැකෙන්නේ ද මෙම ලක්ෂණ අනුවයි. එසේම එම මිශ්‍ර වීම අවසන් වරට සිදුව ඇත්තේ අදින් වසර 14,500කට පෙර පමණ බව ද ගණන් බලා ඇත. මීට අමතරව නැඟෙනහිර ආසියා කලාපය ආශ්‍රිතව ද මෙම මානවයන් හෝමෝ සේපියන් මානවයන් සමඟ මිශ්‍රව ඇති බවට සාක්ෂි පවතී.

ඩැනිසෝවන් මානවයා බිහි වූයේ හෝමෝ හෙයිඩල්බජෙන්සිස් මානවයා පරිණාමය වීමෙන් බව පොදු පිළිගැනීමයි. ඒ මතයන්ට අනුව හෙයිල්ඩල්බජෙන්සිස් මානවයාගෙන් යුරෝපයට සහ බටහිර ආසියාවට සංක්‍රමණය වූ පිරිස් හරහා නියැන්ඩර්තාල් මානවයාත්, ආසියාවට සංක්‍රමණය වූ පිරිස හරහා ඩැනිසෝවන් මානවයාත්, අප්‍රිකාවේ ඉතිරිව සිටි පිරිස හරහා හෝමෝ සේපියන් මානවයාත් පරිණාමය වී ඇත. මෙම මානව විශේෂයන් 3 පොදු පූර්වජයෙකුගෙන් වෙන්ව ඇත්තේ අදින් වසර 7,65,000කට පෙර බව විද්‍යාඥයෝ නිගමනය කරති.

ඩැනිසෝවන් මානවයා මිහිමත විසූ කාලය තුළ හෝමෝ ඉරෙක්ටස්, හෝමෝ හෙයිඩල්බජෙන්සිස්, නියැන්ඩර්තාල්, හෝමෝ සේපියන්, හෝමෝ නලෙඩි, හෝමෝ ෆ්ලොරේසියන්සිස්, හෝමෝ ලුසෙසියන්සිස් යන මානව විශේෂ ද විවිධ ප්‍රදේශ පදනම් කරගනිමින් වාසය කර ඇත. දේශගුණ වෙනස්කම් මෙන්ම හෝමෝ සේපියන් සමඟ තිබුණු තරගය ද ඩැනිසෝවන් මානවයා මිහිමතින් වඳව යන්නට හේතු වන්නට ඇතැයි විශ්වාස කෙරේ.

**මීළඟ කලාපය හා සම්බන්ධයි...**

ජාත්‍යන්තර තොරතුරු GLOBAL NEWS

# ප්‍රංශය විසින් පලස්තීනය පිළිගනු ලබයි

ප්‍රංශ ජනාධිපති එම්මානුවල් මැක්‍රෝන් විසින් පලස්තීනය රාජ්‍යයක් ලෙස පිළිග න්නා බව ප්‍රකාශ කර තිබේ.

මේ වන විට එක්සත් ජාතීන්ගේ සාමාජිකත්වය දරන රටවල් 193ක් අතුරින් රටවල් 147ක් පලස්තීනය නිල වශයෙන් රාජ්‍යයක් ලෙස පිළිගනු ලැබ තිබේ. ලබන සැප්තැම්බරයේදී පැවැත්වෙන එක්සත් ජාතීන්ගේ ප්‍රධාන සමුළුවට මේ සඳහා අදාළ වන නිල ලේඛන ඉදිරිපත් කිරීමට ප්‍රංශය විසින් සූදානම්ව ඇත. G7 රටවල් අතුරින් පලස්තීනය රාජ්‍යයක් ලෙස පිළිගත් ප්‍රථම රට වන්නේ ප්‍රංශයයි. ප්‍රධාන කාර්මිකකරණ රටවල් අතුරින් සැදුම්ලත් G7 එකතුවේ අනෙකුත් සාමාජික රටවල් වන්නේ ඇමෙරිකාව, එක්සත් රාජධානිය, ඉතාලිය, ජර්මනිය, කැනඩාව සහ ජපානයයි. ප්‍රංශයේ මෙම තීරණයත් සමග එක්සත් රාජධානියේ අගමැති කීර් ස්ටර්මර් හට ද පලස්තීනය රාජ්‍යයක් ලෙස පිළිගන්නා ලෙසට දැඩි පීඩනයක් එල්ල වෙමින් තිබේ.

ප්‍රංශයේ මෙම තීරණය සම්බන්ධයෙන් ප්‍රතිචාර දක්වමින්, ඊශ්‍රායල ජනාධිපති බෙන්ජමින් නෙතන්යාහු දැඩි විරෝධයක් දක්වා ඇති අතර, මෙය ත්‍රස්තවාදය දෙසට තැබූ පියවරක් බව ප්‍රකාශ කර ඇත.




ඇමෙරිකානු රාජ්‍ය ලේකම් මැක්‍රෝ රූබියෝ ප්‍රතිචාර දක්වමින්, මෙම තීරණය සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කරන බවත්, නොසැලකිලිමත් තීරණයක් බවත් ප්‍රකාශ කර ඇත. මේ සම්බන්ධයෙන් ප්‍රතිචාර දක්වන පලස්තීන පාලනාධිකාරියේ නියෝජ්‍ය ජනාධිපති හුසේන් අල් ශේක් විසින් ජාත්‍යන්තර නීතිය ක්‍රියාත්මක කිරීමට සහයෝගය දැක්වීම සම්බන්ධයෙන් ස්තූතිය පළ කර ඇත. හමාස් සංවිධානය ද මේ සම්බන්ධයෙන් සුබවාදී අදහස් පළ කර ඇත.

# තායිලන්තය සහ කාම්බෝජය අතර නැවතත් දේශ සීමා ගැටුම්

පසුගිය ජූලි 24 වැනි බ්‍රහස්පතින්දා තායිලන්ත සහ කාම්බෝජ දේශසීමා අතර තියුණු යුද ගැටුම් ආරම්භ විය. මේ වන විට 15 දෙනකු පමණ ගැටුම්වලින් මරණයට පත්ව ඇත.

මෙම දේශසීමා ගැටුම දශක ගණනාවක අතීතයට දිව යයි. යටත්විජිත සමයේ ප්‍රංශයේ යටත්විජිතයක් ලෙස පැවැති මෙම ප්‍රදේශ පසුව ප්‍රංශය විසින් ආන්දෝලානාත්මක අයුරින් දේශසීමාවන් සකසනු ලැබීමෙන් පසුව මෙම අර්බුදය ආරම්භ විය. මතභේදයට ලක්ව ඇති ප්‍රීහා කෝවිලෙහි අයිතිය 1962දී අන්තර්ජාතික අධිකරණය විසින් කාම්බෝජයට ලබා දෙන ලදී. 2008දී කාම්බෝජය විසින් මෙම කෝවිල යුනෙස්කෝ ලෝක උරුමයක් ලෙස නම් කිරීමට යාමේදී නැවත දෙරට අතර කෝවිලෙහි අයිතිය සම්බන්ධයෙන් මතභේදය උග්‍ර විය. එහිදී ඇතිවූ යුද ගැටුම්වලින් 40කට අධික පිරිසක් ඝාතනය විය. පසුගිය මැයි මාසයේදී තායිලන්ත රාජකීය හමුදාවේ සොල්දාදුවන් විසින් කාම්බෝජ සෙබෙළකුව ඝාතනය කිරීමත් සමඟ නැවත උණුසුම් තත්ත්වයක් නිර්මාණය විය. පසුව පසුගිය 24 වැනි බ්‍රහස්පතින්දා ප්‍රීහා කෝවිල අසල දේශසීමාවේදී ඇතිවූ දෙරට හමුදා අතර ගැටුමෙන් මෙම තත්ත්වය උදා විය. තායිලන්තය තුළ ඇතිවී තිබෙන දේශපාලන අර්බුදයත් මෙම තත්ත්වය තීව්‍ර කිරීමට හේතුවක්ව ඇත. පසුගිය ජූනි මාසයේදී තායිලන්ත අගමැතිනි පැටොන්ග්ටර්න් ෂිනවත්‍රා සහ කාම්බෝජ හිටපු අගමැති හන් සෙන් අතර පෞද්ගලික දුරකථන සංවාදයක හඬපටයක් එළිදරවු විය. මෙහිදී තායිලන්ත අගමැතිනිය විසින් රාජකීය හමුදාවේ පාලනයෙන් තොරභාවය සම්බන්ධ අදහස් ප්‍රකාශ කර ඇත. ඉන්පසුව ව්‍යවස්ථා අධිකරණය හරහා ඇයව ධූරයෙන් පහ කරන ලදී. තායිලන්ත රාජකීය හමුදාව හමුදා කුමන්ත්‍රණ හරහා විටින් විට තායිලන්ත පාලනයට තදබල ලෙස බලපෑම් කර ඇත. තායිලන්ත රාජකීය හමුදාව සහ ෂිනවත්‍රා පාලනය අතර ගැටුම දශක ගණනාවක දීර්ඝ කාලයක් තිස්සේ ඇදී යන්නකි.

# ඉන්දියානු ගොවීහු, කම්කරුවෝ වීදි බසිති

පසුගිය ජූලි 9 වැනි දින ඉන්දියාවේ ගොවීන්, කම්කරුවන් විසින් ඉන්දියාව පුරා ජාතික වැඩවර්ජනයක් කැඳවන ලදී. ඉන්දියානු වැඩ කරන ජනතාව මිලියන 250කට අධික ප්‍රමාණයක් වැඩ වර්ජනයට සෘජුවම සහභාගිවී ඇති බව ඉන්දියානු මාධ්‍ය ප්‍රකාශ කර ඇත. ඉන්දියාව පුරා සංවිධානාත්මක ගොවීහු, කම්කරුවෝ මෙන්ම අසංවිධානාත්මක ගොවීහු, කම්කරුවෝද මෙම වැඩ වර්ජනය සඳහා ස්වේච්ඡාවෙන් සහභාගි වී ඇත. ඉල්ලීම් 17ක් මුල් කරගෙන සිදුකරන ලද මෙම වැඩ වර්ජනය ඉන්දියාව අකර්මණ්‍ය කිරීමට සමත්ව ඇත. නරේන්ද්‍ර මෝඩි රජය විසින් 2020දී සම්මත කරන ලද පනත් හතරක් අහෝසි කිරීම ප්‍රධාන ඉල්ලීමවී තිබේ. අනෙකුත් ඉල්ලීම් අතර, පෞද්ගලිකකරණය නැවැත්වීම, ජාතික අවම වැටුප ඉන්දීය රුපියල් 26,000ක් කිරීම, වැඩ බිමේ වැඩ කොන්දේසි සංවර්ධනය ආදිය විය.

වැඩ වර්ජනයට සහයෝගය දැක්වූ ඉන්දියානු ගොවීන් කෘෂි නිෂ්පාදන සඳහා අවම මිලක් යෙදීම, ගොවි ණය කපා දැමීම, ඉඩම් බලහත්කාරයෙන් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය නැවත්වීම ආදී ඉල්ලීම් ඉදිරිපත් කරමින් කම්කරුවන්ගේ වීදි සටන්වලට එක් විය.



## ආර්ථික ස්ථායිකරණය....

01 - පිටුවෙන්

අතර, එය කර්මාන්ත අංශයේ සිදුවූ වර්ධනය විදහා දක්වයි. 04 වගුව

ඉහත සඳහන් සංඛ්‍යාලේඛන අනුව 2024 වසරට වඩා 2025 වසරේ මුල් මාස හය ඇතුළත සංචාරක ව්‍යාපාරයෙන් ඩොලර් මිලියන 156ක් ද, විදෙස් ශ්‍රමික ප්‍රේෂණ ලෙස 598ක් ද, අපනයන ආදායමෙන් ඩොලර් මිලියන 407ක්ද වැඩිපුර උපයා ගෙන ඇත. ඒ අනුව

| විදෙස් ශ්‍රමික ප්‍රේෂණ 2025 පළමු අර්ධ වර්ෂය - ඩො.මි. (03-වගුව) | | |
|---|---|---|
| ජනවාරි | 488 | 573 |
| පෙබරවාරි | 476 | 548 |
| මාර්තු | 572 | 693 |
| අප්‍රේල් | 544 | 648 |
| මැයි | 540 | 640 |
| ජූනි | 520 | 636 |
| එකතුව | 3140 | 3738 |

පසුගිය වසරට සාපේක්ෂව 2025 වසරේ මුල් මාස හය තුළ වැඩිපුර උපයාගෙන ඇති මුළු ප්‍රමාණය ඩොලර් මිලියන 1,161කි. එය අපගේ ආර්ථිකය තිබූ තැනින් ඉහළට එසැවෙන බවට ඇති ප්‍රබල නිර්ණායකයකි. අනෙක් අතට මෙය මාස හය පුරාම ක්‍රමිකව සහ අඛණ්ඩව සිදුවී ඇති නිසා විශේෂ උච්චාවචනයන්ගෙන් තොර බවක්ද දක්නට ලැබේ. වැටුණු ආර්ථිකයක් ගොඩ ගැනීමේදී මෙසේ සාමාන්‍ය පරිදි ක්‍රමානුකූලව සිදුවන වර්ධනයන් අතිශය වැදගත්ය.

| කර්මාන්ත නිෂ්පාදන දර්ශකය (04 වගුව) | | |
|---|---|---|
| | 2024 | 2025 |
| ජනවාරි | 89.7 | 95.2 |
| පෙබරවාරි | 88.0 | 95.3 |
| මාර්තු | 98.4 | 103.9 |
| අප්‍රේල් | 88.1 | 89.6 |
| මැයි | 93.8 | 98.2 |

## මූලධර්ම, උපායමාර්ග .......

08 - පිටුවෙන්

**සම්මුති:**

දේශපාලන ක්ෂේත්‍රයේදී 'සම්මුති' යනු දේශපාලන පක්ෂ අතර, රටවල් අතර මෙන්ම වෘත්තීය සමිති වැනි සංවිධාන වෙනත් පාර්ශ්වයන් සමඟ ඇති කර ගනු ලබන එකඟතාවන්ය. දේශපාලන පක්ෂවලදී වමේ පක්ෂ අතර මෙන්ම වමේ පක්ෂ සහ ධනපති පක්ෂ අතරද සම්මුති ගොඩනැඟේ. එබැවින්, ලෙනින් කියන පරිදි නානාප්‍රකාර සම්මුති ඇත්තේය.

බොහෝ අවස්ථාවලදී සම්මුතිද උපක්‍රමික ක්‍රියාමාර්ග ලෙස භාවිතයට නැඟෙයි.

මාක්ස්-ලෙනින්වාදයට අනුව කොන්දේසි විරහිතව ඕනෑම තත්ත්වයක් යටතේ ඕනෑම වර්ගයක සම්මුති ප්‍රතිපත්තියක් ලෙස පිළිගැනීම වරදක් වන අතර, කොන්දේසි විරහිතව ඕනෑම තත්ත්වයක් යටතේ ඕනෑම වර්ගයක සම්මුති ප්‍රතිපත්තියක් ලෙස ප්‍රතික්ෂේප කිරීමද වරදකි. පළමු වරද දක්ෂිණාංශික අවස්ථාවාදයට වැටෙන අතර, දෙවැනි වරද අතිවාම අවස්ථාවාදයට වැටෙයි.

ලෙනින්ගේ 'අතිවාමාංශික කොමියුනිස්ට්වාදය ළදරු වලිප්පුවකි' ලිපියේ සම්මුති පිළිබඳ ස්වභාවය ඉතාමත් පැහැදිලිව දක්වා තිබේ. තෝරා ගත් කෘති 10 වැනි වෙළුමේ, 184 වැනි පිටුවෙහි සඳහන් පහත උපුටනය සම්මුති පිළිබඳ ස්ථාවරය සරලව පැහැදිලි කර තිබේ.

**"සෑම නිර්ධන පාන්තිකයෙක්ම වැඩ වර්ජන අත්දැක ඇත. කිසිවක් දිනා නොගෙන, නැතහොත්, තමන්ගේ ඉල්ලීම්වලින් කොටසක් පමණක් ලබා ගැනීමට එකඟව කම්කරුවන්ට ආපසු වැඩට යාමට සිදුවූ අවස්ථාවල තමන්ගේ වෛරයට පාත්‍රවූ පීඩකයන් සහ සූරාකන්නන් සමඟ ඇති කර ගත් 'සම්මුති' පිළිබඳ අත්දැකීම ඔහුට තිබේ. වාස්තවික කොන්දේසිවල (වැඩ වර්ජන අරමුදල් නොමැතිකම, බාහිර ආධාර නොලැබීම, කුසගින්න හා විඩාව වැනි) බලපෑම නිසා බලෙන්ම ඇති කර ගැනීමට සිදු වන සම්මුතියක් එනම්, එවැනි සම්මුතියක් ඇති කර ගැනීමට එකඟවූ කම්කරුවන්ගේ විප්ලවවාදී කැපවීම සහ අරගලය කරගෙන යාමේ සූදානම කිසි කලෙකත් හීන නොකරන සම්මුතියක්ද, අනෙක් අතට තමන්ගේ ආත්ම ලාභය (හොරිකඩයෝද 'සම්මුතිවලට' එළැඹෙති!) බියගුලුකම, ධනපතියන්ට ගැතිකම් කිරීමේ ආශාව සහ ධනපතියන්ගේ තර්ජනවලට, වරෙක චාටු කතාවලට, වරෙක සුළු වාසිවලට සහ තවත් වරෙක බොරු වර්ණනාවලට යට වීමට ඇති කැමැත්ත වාස්තවික හේතු වශයෙන් පෙන්වීමට උත්සාහ කරන ද්‍රෝහීන් ඇති කර ගන්නා සම්මුතියක්ද අතර ඇති වෙනස තේරුම් ගැනීමේ හැකියාව සෑම නිර්ධන පාන්තිකයකුටම ඇත."**

නිර්ධන පන්ති ව්‍යාපාරයක ආරක්ෂාව වෙනුවෙන් හෝ මෙන්ම නිර්ධන පන්ති පක්ෂය බලයට පත්වී ඇති රටක අනාගත ජයග්‍රහණ වෙනුවෙන් වෙනත් පාර්ශ්වයන් සමඟ ඇති කර ගනු ලබන උපක්‍රමික සම්මුතියක් සහ විප්ලවීය අරමුණු පාවා දෙමින්, එක්සත් පෙරමුණු වැනි නිර්මාක්ස්වාදී මත තුළ පිහිටමින් ධනපති පන්තිය සමඟ හෝ ඇති කර ගනු ලබන සම්මුතියක් අතර වෙනසද එලෙස වටහාගත යුතුය. සම්මුති පිළිබඳ ප්‍රතිචාර දැක්වීම කළ යුත්තේ, ඉහත වෙනස්කම් හඳුනා ගනිමිනි.

පළමු ලෝක යුද්ධයෙන් බැටකමින් සිටි ළදරු සමාජවාදී සෝවියට් දේශයේ ආරක්ෂාව වෙනුවෙන් 1919 කාල වකවානුවේ ජර්මනිය සමඟ ඇති කර ගත් 'බ්‍රෙෂ්ට් සාම ගිවිසුම' මාක්ස්-ලෙනින්වාදී වශයෙන් සම්මුතිවලට එළැඹීම පිළිබඳ නිරවුල් අවස්ථාවක් නිරූපණය කරනු ලබයි. මෙම අවස්ථාවේද අතිවාම අන්තයෙන් විවේචන එල්ල වුවද, එම සම්මුතිය නිවැරැදි බව ලෙනින් විසින් තහවුරු කරනු ලැබීය.

පොදුවේ ගත් විට වාමාංශික ව්‍යාපාරයක් තම දේශපාලන ගමන්මගේදී ප්‍රතිපත්ති පදනම් වන මූලධර්ම නොසලකා කටයුතු කිරීම වැරැද්දක් වනවා සේම මූලධර්ම හරිහැටි තේරුම් නොගෙන ඒවා දෛනික දේශපාලන ක්‍රියාවලියට බාධා කර ගැනීම හෙවත් මූලධර්මාවදයට වැටීමද වරදකි. මූලධර්ම දේශපාලන ව්‍යාපාරයේ ශක්තිමත් මුල් ගල් කර ගන්නවා වෙනුවට විලංගු බවට පත් කර ගැනීම නොකළ යුතුය.

"අපගේ න්‍යාය ඇදහිල්ලක් නොව **ක්‍රියාකාරීත්වය සඳහා වන මඟපෙන්වීමකි."** මාක්ස්ගේ සහ එංගල්ස්ගේ අදහස එසේ විය.

# මූලධර්ම, උපායමාර්ග, උපක්‍රම සහ සම්මුති

**දේශපාලන ක්‍රියාකාරීත්වයේදී පමණක් නොව වෙනත් සාමාන්‍ය කටයුතුවලදීද පන්ති අර්ථයෙන් වියුක්තව පවා විවිධ මූලධර්ම, උපායමාර්ග, උපක්‍රම, සම්මුති, එකඟතා, ගිවිසුම් ඇති කර ගැනීම සාමාන්‍ය දෙයකි. මෙහිදී අප සලකා බලනු ලබන්නේ දේශපාලන ක්ෂේත්‍රයේදී විශේෂයෙන් වාමාංශික දේශපාලන සංවිධාන මෙම සංකල්ප භාවිතාවට නැගීම පිළිබඳවය.**

ලෙනින්ට අනුව සංක්ෂිප්තව ගත් විට දේශපාලනය යනු පන්ති අතර සම්බන්ධතාවයි. පවතින සමාජ ක්‍රමය පෙරළා දමා සූරාකෑමෙන් තොර නව සමාජ ක්‍රමයක් ගොඩනැගීමට කටයුතු කරන දේශපාලන ව්‍යාපාරවලට මඟපෙන්වනු ලබන මූලික මූලධාර්මික කරුණු ඇතුළත් න්‍යායික පදනමක් තිබෙන අතරම, ඊට යටත්ව විවිධ උපායමාර්ග සහ ඊට අනුරූප උපක්‍රම අනුගමනය කිරීමට සිදුවේ.

### මූලධර්ම හා උපායමාර්ග:

දිගුකාලීන ක්‍රියාමාර්ග වන උපායමාර්ග සාපේක්ෂව ස්ථාවර සහ නිතර වෙනස් නොවන අතර, ඒවා පදනම් වන්නේ තමන්ට මඟපෙන්වනු ලබන දර්ශනයේ මූලධර්ම මතයි. තමන්ට මඟපෙන්වන දර්ශනයේ (නිර්ධන පන්ති ව්‍යාපාරයක් නම්, මාක්ස්-ලෙනින්වාදය) මූලධර්ම පිළිබඳ වැටහීමක් හෝ මූලධර්මවල වැදගත්කම නොසලකන ව්‍යාපාරයකට කොතරම් දක්ෂ ක්‍රියාකාරීත්වයක් තිබුණද, මඟ වැරදීමේ ඉඩකඩ වැඩිය. එසේ වන්නේ දේශපාලන මූලධර්ම අමතක කරන නිසා හෝ නොසලකා හරින නිසා හෝ මූලධර්ම පිළිබඳ නිවැරදි අවබෝධය නොමැතිකමිනි.

සමාජවාදී සමාජ විප්ලවය යනු ඉතාම සුළු පිරිසකගේ කුමන්ත්‍රණයක් නොව අතිමහත් සමාජ අවශ්‍යතාවක ප්‍රතිඵලයක් හා පළල් ජනතා ක්‍රියාකාරීත්වයක ප්‍රතිඵලයක්ය යන්න මූලධර්මයකි. එසේම පන්ති සහයෝගීතාවාදය ප්‍රතික්ෂේප කරමින්, පන්ති සටන පිළිගැනීමද මූලධර්මයකි. සමාජ පරිවර්තන යුගයේදී නිර්ධන පන්ති රාජ්‍ය බලය පිළිගැනීමද මූලධර්මයකි. සියලු ප්‍රපංචයන් පවතින්නේ චලිතයේය යන්නද මූලධර්මයකි.



### උපක්‍රම:

උපක්‍රම යනු දේශපාලනයේ සිදුවන දෛනික වෙනස්කම්වලට අනුව වෙනස් කළ යුතු කෙටිකාලීන ක්‍රියාමාර්ගයි. මෙම උපක්‍රම හැමවිටම උපායමාර්ග යට ප්‍රතිවිරෝධී නොවීමට වග බලාගත යුතුය. මෙහිදී දේශපාලන ව්‍යාපාරයක් උපක්‍රම තේරීමේදී වඩා හොඳම උපක්‍රම තෝරා ගැනීමට දක්ෂ විය යුතු අතර, එක් උපක්‍රමයක් යල්පනින විට වහාම එය අතහැර නව උපක්‍රමයකට මාරුවීමට තරම් නම්‍යශීලීද විය යුතුය. මෙහිදී දේශපාලන ව්‍යාපාරයක් උපක්‍රම සහ උපායමාර්ග අතර ඇති වෙනස මෙන්ම අන්තර් සම්බන්ධයද වටහාගත යුතුය.

මේ අනුව මූලධර්ම, උපායමාර්ග සහ උපක්‍රම යනු දේශපාලනයේ සංකල්ප තුනක් වන අතර, මේවා එකිනෙකින් වෙනස් වෙයි. ඒ අතරම එකිනෙක හා අන්තර් සම්බන්ධයක්ද සහිතය. විශේෂයෙන්ම උපක්‍රමවලදී නිශ්චිත මොහොතකට තෝරන උපක්‍රම වෙනස්වූ පසුද එලෙසින්ම අනුගමනය කිරීමට උත්සාහ දැරීම නිර්ධන පන්ති ව්‍යාපාරය තුළ මතුවන අවස්ථාවාදයේ එක් ආකාරයක් නිරූපණය කිරීමකි. නිදසුනක් ලෙස වැඩවසම් රුසියාව පැවැති කාලයේ (1905) සමාජ විප්ලවය සඳහා ලෙනින් අනුගමනය කළ උපක්‍රම එම තත්ත්වය වෙනස්වී රුසියාවේ ධනේශ්වර විප්ලවය සිදුවූ පසුවත් (1917 පෙබරවාරි) වෙනස් නොකර අනුගමනය කිරීමට උත්සාහ කළ බොල්ෂෙවික්වාදීන්ට ලෙනින් පැවසුවේ, ඔවුන් සුදුසු වන්නේ දේශපාලන කෞතුකාගාරයට බවය. පැරණි කුණු තැවරුණු කමිස ඉවතලා නව කමිස ඇඳ ගන්නා ලෙස ලෙනින් ඔවුන්ට පැවසුවේ එබැවිනි.



**"උපක්‍රම ගැන කියතොත්, යථායෝග්‍ය වන්නාවූ සියලුම සැලැසුම් හා විධි ප්‍රතිපත්ති වශයෙන් පිළිගැනීමත්, නියමිත දේශපාලන අවස්ථාවකදී දැඩි ලෙස අනුගමනය කරනු ලබන සැලැස්මකින් මඟපෙන්වීම ලබා ගැනීම සඳහාවූ ඉල්ලීමත් යන දෙක එකට පටලවා ගැනීම යනු, ව්‍යාධි සුව කිරීම සඳහා වෛද්‍ය විද්‍යාව විසින් විවිධ ප්‍රතිකාර ක්‍රම පිළිගනු ලැබ තිබීමත්, නියමිත ව්‍යාධියක් සුව කිරීම සඳහා කිසියම් නියමිත ප්‍රතිකාර ක්‍රමයක් අනුගමනය කිරීමේ අවශ්‍යතාවත් යන දෙක එකට පටලවා ගැනීම හා සමාන දෙයකි."**

(-ලෙනින්, තෝරා ගත් කෘති, 1 වැනි වෙළුම, 162 වැනි පිටුව.)